රජ වාසල කවටයා හැටියට
අන්දරේ විහිළු තහළුවෙන් කල් ගෙව්වා.
අන්දරේ රජතුමා හිනැස්සෙව්වා.
ඉඳහිට අග බිසොවුන් වහන්සේත් හිනැස්සෙව්වා.
කලාතුරකින් දවසක
රජතුමාටයි බිසොවුන්නාන්සෙටයි
දෙන්නාටම තරහත් ගියා.
ඒ වුණාත් මොනවා කරන්ට ද
අන්දරේ රජ වාසල කවටයා නෙ.

(c) Sumitha Publishers


(c) Sumitha Publishers

අන්දරේ හපන් විහිළු තහළුවට විතරක් නොවෙයි
ඔහුට හොඳ සිහි කල්පනාවකුයි
නුවණක්කාරකමකුයි තිබුණා.

එක දවසක් අන්දරේ
ගෙදර පැත්තට යමින් හිටියා.
මිනිස්සු දෙන්නෙක් මොනවාදෝ හොය හොයා යනවා.
අන්දරේ ඒ දෙන්නා දිහා බලලා ඇහැව්වා
‘නැති වෙච්ච ගොනෙක් ද හොයන්නෙ?’ කියලා.

(c) Sumitha Publishers

ඒ මිනිස්සු දෙන්නාට හරිම සන්තෝසයි.
“ඔව්, නැති වෙච්ච ගොනෙක් තමයි අපි හොයන්නෙ.
කරුණා කරලා කියනවා ද උෟ ඉන්නෙ කොහෙද කියලා.”

අන්දරේ වචනයක් වත් කතා නොකර
ගෙදර පැත්තට යන්ට පටන් ගත්තා.


(c) Sumitha Publishers